WORKED.

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,423—1958 ජූලි 11 වැනි සිකුරාදා—11.7.1958

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ... | 1813 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | 1814 |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | 1814 |
| වෙනත් පත් කිරීම් ... ... ... | 1815 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 1816 |
| මිළ පාලන දැන්වීම .... .... .... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 1816 |
| " සුරාබදු ආඥාපණත " පිළිබඳ දැන්වීම් ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම්

### 1958 අංක 285

ජී. ජී ඕ. අංකය : සී. 218/56.

වාණිජ හා වෙළඳ ඇමති තැන්පත් ගරු ආර්. ජී. සේනානායක පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා දිවයිනෙන් බැහැරව සිටින කාලය තුළ, 1946යේ හා 1947තේ ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජසභා නියෝගවල 49 (3) වැනි වගන්තිය යටතේ අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින්, වාණිජ හා වෙළඳ ඇමති තුමාගේ පාර්ලිමේන්තු ලේකම්, ලක්ෂ්මන් රාජපක්ෂ, පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා, 1958වේ ජූලි මස 5 වැනි දින සිට, වාණිජ හා වෙළඳ ඇමති වශයෙන් වැඩ බැලීමට පත්කරනු ලැබ සිටී.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1958 ජූලි මස 5 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කායඹාලයේ දීය.

---

### 1958 අංක 286

අංකය : ඩී.17/රෙක්ට්.

**යුධ හමුදව—නිත්‍ය හට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද පත් කිරීමක්**

1949 අංක 17 දරණ යුධ හමුද පනතේ 13 (1) වගන්තිය යටතේ 1958 ජූලි මස 1 වැනි දින සිට බඳවා ගන්නා නිළධාරි තැන වශයෙන්—

තාවකාලික මේජර් තැන්පත් ඇම්. ඩබ්ලිව්. ජී. ජී. රණතුංග, සී. ඒ. ජී. ඇස්. සී.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. ද සොයිසා,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1958 ජූලි මස 5 දින.
කොළඹ 1.

### 1958 අංක 287

අංකය : ඩී. 1/රෙක්ට්/27.

**යුධ හමුදව—නිත්‍ය හට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද කොමිෂන් බලපත්‍ර සහ පත් කිරීම්**

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් පහත සඳහන් කරන ලද මහත්වරුන් යුධ හමුදවේ නිත්‍ය හට සේනාවේ කොමිෂන් බලපත්‍ර ලත් කපිතන් වරුන් වශයෙන් පත්කිරීම සහ ඔවුන් ලංකා යුධ හමුදවේ වෛද්‍ය බලකායට ඔවුන්ගේ නම්වලට කෙළින් සඳහන් කර තිබෙන දින සිට ඇතුළත් කිරීම අනුමත කොට තිබේ :—

දෙස්තර ජෝන් මෝහන්දස් කුමාරස්වාමි. 1958 ජූලි මස 1 වැනි දින.

දෙස්තර සානවලගේ ප්‍රැන්සිස් නොඑල් පෙරෙරා. 1958 ජූලි මස 14 වැනි දින.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. ද සොයිසා
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1958 ජූලි මස 2 දින.
කොළඹ 1.

---

### 1958 අංක 288

අංකය : ඩී.42/රෙක්ට්.

**රාජකීය ලංකා නාවුක හමුදව—නිලධාරියෙක් පත් කිරීමක්**

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් රාජකීය ලංකා නාවුක හමුදවේ පහත සඳහන් කරන ලද පත් කිරීම් අනුමත කොට තිබේ :—

1958 ජූනි මස 27 වැනි දින සිට, රාඥියන් වහන්සේගේ ලංකා සේවයෙහි නියුක්ත ගැමුණු 1 නෞකාවේ අණදෙන නිළධාරි තැන වශයෙන්—

කොමාන්ඩර් තැන්පත් ඒ. සී. දසනායක, රාජකීය ලංකා ස්වේච්ඡා නාවුක හමුදව.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. ද සොයිසා,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1958 ජූලි මස 5 දින,
කොළඹ 1.

1813—ජේ. ඇන්. බී 4832—3,847 (7/58)

# රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්

**1958 අංක 289**

රාජ්‍ය සේවා කොමිෂන් සභාහෙන් පහත සඳහන් පත්වීම් කරන ලෙස නියමකර ඇත්තේය :—

ඒ. 175/55.

අනුරාධපුරය පාලන් දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත ඩී. අළුවිහාරේ මහතා (සී.සී.ඇස්.) 1958 මැයි මස 17 වැනි දින සිට 1958 ජූනි මස 1වෙනි දින දක්වා, ස්වකීය රාජකාරිවලට අතිරේක වශයෙන්, පොලොන්නරුව පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත වශයෙන් වැඩ බැලීමට.

ඒ. 173/58.

වී. පී. ඒ. පෙරේරා මහතා (සී.සී.ඇස්.) 1958 මැයි මස 31 වෙනි දින සිට, නැවත නියමයක් කරන තුරු, මාතලේ පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත වශයෙන් වැඩ බැලීමට.

ඒ. 173/57.

ඒ. අයි. මොහිදීන් මහතා (සී.සී.ඇස්.) 1958 ජූනි මස 2 වෙනි දින සිට, නැවත නියමයක් කරනතුරු, මාතර පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත වශයෙන් වැඩ බැලීමට.

ඒ. 140/57.

ටී. රාජතුරෙයි මහතා (සී.සී.ඇස්.) 1958 ජූනි මස 9වෙනි දින සිට, නැවත නියමයක් කරන තුරු, මහා භාණ්ඩාගාරයේ සංවිධාන සහ ක්‍රම කොට්ඨාශයේ සහකාර අධ්‍යක්ෂ වශයෙන්

ඊ. ජී. ගුණවර්ධන,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1958 ජූලි මස 8 වැනි දින,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්‍යාලය,
තැ. පෙ. 500, කොළඹ 1.

---

**1958 අංක 290**

ඒ.203/58.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව, 1958 ජූනි මස 21වෙනි දින සිට ඇටෝර්නි ජනරාල් දෙපාර්තමේන්තුවේ පහත් සඳහන් වැඩ බැලීමේ පත්වීම් කර ඇත්තේය :—

(1) ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥ වී. තෙන්නකෝන් මහතා නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් වශයෙන්.

(2) ආණ්ඩුවේ අධිනීතිඥ බී. සී. ඇෆ්. ජයරත්න මහතා ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥ වශයෙන්.

ඊ. ජී. ගුණවර්ධන,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1958වේ ජූලි මස 8 වැනි දින,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්‍යාලය,
තැ. පෙ. 500, කොළඹ 1.

---

# අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්

**1958 අංක 291**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේය :—

අංකය : ජේඒඒ.21/48.

ඒ. ඊ. ආර්. කොරෙයා මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1958 ජූලි 4 වැනි දින, ගම්පොල මහෙස්ත්‍රාත් උසාවියේ අංක 2,480 නඩුවේ තීන්දුව දීමට, ගම්පොල අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට.

අංකය : ජේඒඒ. 10/48.

සී. බී. වල්ගම්පාය මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1958 ජූලි 11 වැනි දින, හලාවත මහෙස්ත්‍රාත් උසාවියේ අංක 20,538 (එන්. එස්), 17,347, 17,868 නඩු ඇහිමට, හා 1958 ජූලි 30 වැනි දින, හලාවත මහෙස්ත්‍රාත් උසාවියේ අංක 22,411 නඩුව ඇහිමට හලාවත අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා හලාවත අතිරේක දිස්ත්‍රික් නඩුකර ධූරයට.

අංකය : ජේඑම්. 7/53.

ටී. එස්. සලි මහතා 1958 ජූලි 1 වැනි දින පටන්, නැවත නියමයක් කරන තුරු, ලංකා අධිකරණ සේවයේ නිලධාරියෙක් වශයෙන්.

අංකය : සීජේඑම්. 2/51.

ජේ. ජී. එල්. සුවාරිස් මහතා ලංකා අධිකරණ සේවයේ නිලධාරියෙක් වශයෙන් වැඩබැලීමට, හා 1958 ජූලි 1 වැනි දින පටන්, නැවත නියමයක් කරන තුරු, ගාල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට, ගාල්ලේ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධූරයට, හා ගාල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේඒඒ. 48/48.

එල්. එස්. ප්‍රනාන්දු මහතා 1958 ජූලි 2 වැනි දින, පානදුරේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 52,224 නඩුවේ තීන්දුව දීමට, පානදුරේ අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට, හා පානදුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට

අංකය : ජේඑල්. 59ඒ/56.

ඒ. එම්. ඇෆ්. සිරිවර්ධන මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ටී. බී. යටවර මහතා 1958 ජූනි 27 වැනි දින පටන් 1958 ජූලි 1 වැනි දින දක්වා, ගම්පොල අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට, හා මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේඒඒ. 53/48.

එච්. ආර්. පීරිස් මහතා 1958 ජූලි 12 වැනි දින, රත්නපුරේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 61,655ඒ; 64,164; 63,673ඒ; 63,035ඒ; 63,675ඒ; 63,576ඒ නඩු හා රක්වානේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 61,502ඒ නඩුව ඇහිමට, රත්නපුරේ අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට, හා රත්නපුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේඑල්. 62ඒ/57.

ජේ. ඇෆ්. ඒ. සෝසා මහතා වැඩ බාරගන්නා තුරු හෝ නැවත නියමයක් කරන තුරු, ටී. ඇෆ්. බිලාසේ මහතා 1958 ජූලි 1 වැනි දින පටන්, බදුල්ල–හල්දුම්මුල්ල අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට, හා බදුල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේඒඒ. 50/48.

එම්. එසුරපාඩිහම් මහතා 1958 ජූලි 26 වැනි දින, පේදුරු තුඩුවේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 3,561 නඩුව ඇහිමට, පේදුරු තුඩුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට, හා පේදුරු තුඩුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේඑල්. 49ඒ/53.

එම්. පී. සී. රත්නම් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, පී. ජී. ද සිල්වා මහතා 1958 ජූලි 1 වැනි දින, අවිස්සාවේල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට, හා අවිස්සාවේල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේඑල්. 2/48.

ඇෆ්. ඊ. ඇලස් මහතා නැවත වැඩ බරගන්නා තුරු හෝ නැවත නියමයක් කරන තුරු, එන්. කුමාරසාමි මහතා 1958 ජූලි 1 වැනි දින පටන්, මහනුවර අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට, මහනුවර අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධූරයට, මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට, හා දුම්බර අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට.

අංකය : පීඑල්/එච්. 3/48.

ඒ. හෝමර් වන්නායසිංකම් මහතා නැවත වැඩ බාරගන්නා තුරු, හෝ නැවත නියමයක් කරන තුරු, වී. ආර්. සත්චිත්තානන්දන් මහතා 1958 ජූනි 26 වැනි හා 27 වැනි දිනයන්හි, හා 1958 ජූලි 1 වැනි දින පටන්, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කඩ්ඩුකුලම් හා තම්පලකාමම් පත්තු ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එච්. 5/56.

සී. බී. හුනුකුඹුර මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එම්. ආර්. තාසීම් මහතා 1958 ජූලි 2 වැනි හා 3 වැනි දිනයන්හි, තංගල්ල දිස්ත්‍රික්කයේ නැගෙනහිර ගිරුව හා මාගම් පත්තු ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/කේ. 6/48.

ඩබ්ලිව්. කුරුප්පු මහතා නැති අතර, වී. ඩයස් මහතා 1958 ජූලි 4 වැනි දින, ගම්පහ දිස්ත්‍රික්කයේ නැගෙනහිර සියනෑ කෝරලේ, බටහිර සියනෑ කෝරලේ (මැද පත්තුව) හා හාපිටිගම් කෝරලේ ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට හා දකුණු අළුත්කුරු කෝරලේ ගම්බද උසාවියේ අතිරේක සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඇෆ්. 1/56.

ඒ. එල්. ඇම්. ප්‍රනාන්දු මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඩී. ස්රසිංහ මහතා 1958 ජූලි 4 වැනි හා 5 වැනි දිනයන්හි, හා 7 වැනි දින පටන් 10 වැනි දින දක්වා, තංගල්ල දිස්ත්‍රික්කයේ බටහිර ගිරුව පත්තුවේ ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට

අංකය : පීඑල්/කේ. 4/48.

කේ. අයි. කරුණාරත්න මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එම්. ඒ. සී. ද සිල්වා මහතා 1958 ජූලි 1 වැනි, 2 වැනි, 9 වැනි හා 10 වැනි දිනවල කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරලේ, සල්පිටි කෝරලේ හා කොළඹ ආදායම් පාලක නිලධාරි තුමාගේ කොට්ඨාශයේ ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට.

එස්. ආර්. විජෙයතිලක,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1958 ජූලි 3 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්‍යාලය,
තැ. පෙ. 573, කොළඹ 12.

---

# වෙනත් පත් කිරීම්

**1958 අංක 292**

අංකය: ඩී. 10/රෙක්ට්.

## රාජකීය ලංකා නාවුක හමුදාව—නිලධාරීන් පත් කිරීම්

1958 ජනවාරි මස 10 වැනි දින සිට වැඩබලන කොමිෂන් බලපත්‍ර ලත් බෑන්ඩ් මාස්ටර් කෙනෙකු වශයෙන් —

ප්‍රධාන පෙටි ඔපිසර් තැන වන ඒ. වී. ධර්මරත්නම්.

ජී. ද සොයිසා,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යංශයේ ස්ථිර ලේකම්.

1958 ජූනි මස 27 දින,
කොළඹ,

---

**1958 අංක 293**

අංකය : ඒ.එම්.2/1/58.

අග්‍රාණ්ඩුකාර උතුමාණන්වහන්සේ ගරු අධිකරණ අමාත්‍යවරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව එතුමා විසින්—

බී. ඒ. ජයසිංහ මහතා කොළඹ නගර සභාවේ විශේෂ කොමසාරිස් ධුරය දරණ කාලය තුල කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවෙකු සහ නිල නොලත් මහේස්ත්‍රාත් වරයෙකු වශයෙන්ද,

ටී. ජී. ගුණසේකර මහතා සහකාර කම්කරු චන්දි කොමසාරිස්වරයෙකු වශයෙන් කටයුතු කරන කාලය තුල මුළු දිවයිනටම සමාදාන විනිශ්චය කරුවකු වශයෙන්ද,

පත්කර ඇත්තේය.

---

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 1947 සැප්තැම්බර් මස 18 වෙනි දින අග්‍රාණ්ඩුකාර උතුමාණන්වහන්සේගේ නිවේදනයකින් සංශොධනය කරනලද 372 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින් එම සිවිල් නඩු විධාන සංග්‍රහයේ 371 වෙනි වගන්තියේ සඳහන් දිවරුම් සහතික කිරීම පිණිස 1958 ජූනි මස 27 වෙනි දින සිට මුලතිව් ආදායම් පාලක නිලධාරිතැනගේ කාර්‍යාලයේ ප්‍රධාන ලිපිකාර ඒ. ජේ. සබාරත්නම් මහතා මුලතිව් පිස්කල් මාෂල්තැන වශයෙන් වැඩ බලන කාලය තුල වවුනියා අධිකරණ කොට්ඨාශයට විශේෂ නිලධාරියෙක් වශයෙන්,

පත්කර ඇත්තේය.

---

ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 16 වෙනි පරිච්ඡෙදයේ 120 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින්—

1958 ජූනි මස 23 වෙනි දින සිට, එස්. එම්. සවාන්තු මහතා නැවත වැඩ භාරගන්නා තුරු, මන්නාරම් දිස්ත්‍රික්කයේ නැගෙනහිර නානාදන් කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ඒ. දුරෛසාමි මහතාද,

1958 ජූනි මස 25 වෙනි දින සිට, එල්. එස්. පීටර්ස් මහතා නැවත වැඩ භාරගන්නා තුරු, හලාවත දිස්ත්‍රික්කයේ දකුණු පිටිගල් කෝරළේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ඩබ්ලිව්. ඒ. ප්‍රනාන්දු මහතාද,

1958 ජූනි මස 26 වෙනි දින සිට මාතලේ දිස්ත්‍රික්කයේ කොහොන්සිය පත්තුවේ මාතලේ දකුණ සහ නැගෙනහිර කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයට ටී. විමලසිංහ මහතාද,

1958 ජූනි මස 28 වෙනි දින සිට, කේ. පී. එස්. විජේතුංග මහතා නැවත වැඩ භාරගන්නා තුරු, බදුල්ල දිස්ත්‍රික්කයේ රිල්පොල සහ බෝගොඩ කෝරලවල හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට එස්. විජේතුංග මහතාද,

1958 ජූලි මස 1 වෙනි දින සිට, එස්. බී. දෙලුන්ගහවත්ත මහතා නැවත වැඩ භාරගන්නා තුරු, බදුල්ල දිස්ත්‍රික්කයේ උඩුකිඳ කොට්ඨාශයේ යටිපළාත සහ මැදපළාත කෝරලවල හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට එම්. බී. සමරකෝන් මහතාද,

1958 ජූලි මස 1 වෙනි දින සිට, පී. එල්. පැට්රික් මහතා නැවත වැඩ භාරගන්නා තුරු, මඩකලපු දිස්ත්‍රික්කයේ අක්කරෙයි පත්තුවේ ආදායම් පාලක ධුරයෙහි වැඩ බලන කාලය තුල එම පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ඩී. ඒ. ජේ. කාසිනාදර් මහතාද,

1958 ජූලි මස 3 වෙනි දින සිට තිරිකුණාමල දිස්ත්‍රික්කයේ නැගෙනහිර කඩුකුලම් පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයට කේ. යූ. එස්. ත්‍යාගරාජා මහතාද,

1958 ජූලි මස 5 වෙනි දින සිට, ජේ. එම්. සබාරත්නම් මහතා නැවත වැඩ භාරගන්නා තුරු, මඩකලපු දිස්ත්‍රික්කයේ කරවාකු පත්තුවේ ආදායම් පාලක ධුරයෙහි වැඩ බලන කාලය තුල එම පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ආර්. සිත්තම්පරපිල්ලෙයි මහතාද,

පත්කර ඇත්තේය.

---

පහත සඳහන් ආදායම් පාලක නිලධාරීන් ඒ ඒ කොට්ඨාශවල හදිසි මරණ පරීක්ෂකවරු වශයෙන් ගරු අධිකරණ ඇමතිතුමා විසින් පත්කර ඇත. එසේම ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 365 (i) වෙනි වගන්තිය යටතේ අවශ්‍ය වූ විට හදිසි මරණයක් සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණ පැවැත්වීමේ බලයද ඔවුන්ට පවරා ඇත :—

| ආදායම්පාලක නිලධාරියාගේ නම | | කොට්ඨාශය | | පත්කළ දිනය |
|---|---|---|---|---|
| (1) එක්ස්. එම්. සෙල්ලතම්බු | ... | ඉරවූර් කෝරළේ පත්තුව | ... | 58.4.9 |
| (2) එස්. එම්. තියොපිලස් | ... | මන්මුනෙයි උතුර | ... | 58.5.3 |
| (3) ජේ. ඩී. ආනොල්ඩ් | ... | මන්මුනෙයි දකුණ සහ ඉරුවිල් පොරතිව් | | 58.5.6 |
| (4) බී. ඒ. ජේ. කාසිනාධාර් | ... | පනාම පත්තුව | ... | 58.5.3 |
| (5) කේ. බී. සූරියගොඩ | ... | බින්තැන්න පත්තුව | ... | 58.2.12 |

ජී. සී. ටී. ඒ. ද සිල්වා,
අධිකරණ අමාත්‍යංශයේ වැඩබලන් ස්ථිර ලේකම්.

1958 ජූලි මස 8 වෙනි දින,
කොළඹ අධිකරණ අමාත්‍යංශයේදීය.

---

**1958 අංක 294**

1950හේ අංක 25 දරණ ආහාර පාලන පනතේ 2 වැනි වගන්තිය යටතේ සෙම්බකුට්ටිගේ විල්ෆ්‍රඩ් ආතර් ද සිල්වා මහතා මුළු දිවයිනේ සහකාර ආහාර පාලකයෙකු වශයෙන් 1958 ජූනි 16 වැනි දින සිට පත්කොට තිබෙන බව මින් දන්වමි.

ධර්මසේන ජයනෙත්ති,
ආහාර පාලක සහ ආහාර කොමසාරිස්.

1958 ජූලි 2 වැනි දින,
ආහාර කොමසාරිස් කාර්‍යාලය.
යූනියන් පෙදෙස, කොළඹ,

# ආණ්ඩුවේ නිවේදන

ජී.ජී.ඕ. අංකය : ආර්/157/51.

පහත නම් සඳහන් ලංකා පොලිස් සේවයේ නිලධාරීන් වෙත, ලංකා පොලිස් දක්ෂතාවය පිළිබඳ පදක්කම ප්‍රධානය කිරීමට අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ අනුමත කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ:—

උප පොලිස් සුපිරින්ටැන්ඩන්ට් බර්ට්‍රම් වීරසිංහ මහත්මයා,

පොලිස් ඉන්ස්පැක්ටර් දොන් දයාපාල සෝමභද්‍ර කුමාර රණසිංහ මහත්මයා

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1958 ජුලි මස 7 වෙනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලය.

---

## වැටුප් සහ සේවක සංඛ්‍යා කොමිසම

රජයේ සේවකයන්ගේ ද උපකෘත පාඨශාලා ගුරුවරුන්ගේ ද වැටුප්, දීමනා සහ අනෙකුත් සේවා කොන්දේසි පිළිබඳ කරුණු සැළකර සිටින ලෙස ආරාධනය කෙරෙමින් 1958 ජූනි මස 12 වැනි සහ 16 වැනි යන මේ දින වල ප්‍රවෘත්ති පත්‍රයන්හි මෙන් ම 1958 ජූනි මස 20 වැනි දිනය දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි ද පළවුණු දැන්වීමට ඔබේ ආවධානය යොමු කරනු ලැබේ.

2. කරුණු සැළකර සිටීමට තවත් කල් දෙන ලෙස කීප දෙනකුගෙන් ම ඉල්ලීම් ලැබී ඇති හෙයින්, මේ කාර්යාලයට ඒ සම්බන්ධයෙන් එවන සන්දේශ 1958 ජුලි මස 21 වැනි ද දක්වා නොව 1958 අගෝස්තු 5 වැනි දින දක්වා බාරගැනීමට කොමිසම තීරණය කර තිබේ.

එන්. ජේ. එල්. ජැන්ස්,
ලේකම්.

1958 ජුලි මස 4 වැනි දින,
වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසම,
127, මැකාති පාර,
කොළඹ 7.

---

## 1941 අංක 27 දරණ කම්කරු පඩි සභා ආඥාපනත

වර්ෂ 1943 අංක 40 දරන ආඥාපනතින් සහ 1953 අංක 5 දරන පනතින් සංශෝධිත වර්ෂ 1941 අංක 27 දරන කම්කරු පඩි සභා ආඥාපනතේ 28 වන වගන්තියෙන් තමන්ට ලැබී ඇති බලය පිට මීට යාව ඇති උපලේඛනයෙහි සවිස්තරව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට ඉංජිනේරු කර්මාන්ත පිළිබඳ කම්කරු පඩි සභාව අදහස් කරන බව පූර්වෝක්ත කම්කරු පඩි සභා ආඥාපනතේ 26ඒ වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ යෝජනාවට විරුද්ධව කීමට ඇති කරුණු සලකා බැලීම සඳහා වර්ෂ 1958 ජුලි මස 28 වන දින දවල් 12 දක්වා එම කම්කරු පඩි සභාවේ ප්‍රධාන තැන විසින් බාර ගන්නවා ඇත.

ඉදිරිපත් කරන සෑම විරුද්ධත්වයක් එසේ විරුද්ධ වීමට හේතු භූතවූ කරුණු පිළිබඳ ප්‍රකාශයක්ද සහිත ලියවිල්ලකින් විය යුත්තේය.

සී. බී. කුමාරසිංහ,
ඉංජිනේරු කර්මාන්තය පිළිබඳ කම්කරු පඩි සභාවේ ප්‍රධාන තැන.

1958 ජුලි මස 5 වන දින,
කොළඹ දීය.

### උපලේඛනය

ඉංජිනේරු කර්මාන්තය පිළිබඳ කම්කරු පඩි සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1945 අගෝස්තු මස 10 වන දින අංක 9,447 දරන ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තා වූ ද වර්ෂ 1946 පෙබරවාරි මස 22 වන දින අංක 9,523 සහ වර්ෂ 1948 පෙබරවාරි මස 27 වන දින අංක 9,837 දරන ගැසට් පත්‍ර වලද වර්ෂ 1951 මාර්තු මස 30 වන දින අංක 10,229, වර්ෂ 1953 ජූනි මස 29 වන දින අංක 10,542 සහ වර්ෂ 1955 ජූනි මස 30 වන දින අංක 10,811 දරන විශේෂ ගැසට් පත්‍ර වල සහ වර්ෂ 1957 දෙසැම්බර් මස 27 වන දින අංක 11,224 සහ වර්ෂ 1958 පෙබරවාරි මස 28 වන දින අංක 11,268 දරන ගැසට් පත්‍රවල ද පළ කරනලද නිවේදනයන්හි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කරන ලද්ද වූ ද තීරණ එම උපලේඛනයේ II වන කොටසේ '' වැඩකාරයින්ගේ පන්තිය '' යන ශීර්ෂය යටතේ මෙහි පහත දැක්වෙන පරිද්දෙන් තව දුරටත් වෙනස් වේ:—

(අ) '' අර්ධ වශයෙන් පුහුණු (අඩ පුහුණු) කම්කරුවෝ—1 වර්ගය '' යන උප ශීර්ෂය යටතේ ඇති '' දොඹකර ක්‍රියා කරවන්නෝ '' යන කරුණ ඉවත් කිරීමෙන් ; සහ

(ආ) '' පුහුණු වූ (දක්ෂ) කම්කරුවෝ '' යන උප ශීර්ෂය යටතේ ඇති '' රිවැටර්වරු සහ කෝකර්වරු '' යන කරුණු අස්කොට ඒ වෙනුවට '' රිවැටර්වරු සහ කෝකර්වරු ; දොඹකර ක්‍රියා කරවන්නෝ '' යන කරුණු යෙදීමෙන් ද වේ.

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## '' හෙමරජික් සෙප්ටිසීමියා '' නමැති භයානක ගව රෝගය

වයඹ පලාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පොල හත්පත්තුවේ බස්නාහිර මැදපත්තු සහ පිටිගල් කෝරළයේ බෝවත්ත, නැදලගමුව රද්දලන, මාකඳුර, ඇලබඩගම යන පලාත්වල ගවයින් අතර '' හෙමරජික් සෙප්ටිසීමියා '' නමැති රෝගය පැතිරයන බැවින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ දිසාපති තැන්පත් ඇන්තනි ලොයිඩ් පෙරේරා වන මා විසින්, සතුන්ගේ බෝවන රෝග සම්බන්ධ ආඥාපනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ පහත සඳහන් සීමා ඇතුලත පිහිටි ප්‍රදේශ බෝවන රෝග ඇති ප්‍රදේශයන් ලෙස සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි.

1. බෝවත්ත පළාත/බස්නාහිර මැදපත්තු කෝරලය
   උතුරට: නැදගමුව සහ රද්දලන පළාත් ;
   දකුණට: ඇලබඩගම සහ ගලයාය පළාත් ;
   නැගෙණහිරට: නැදලගමුව සහ මඩිගෙපොල පළාත් ;
   බස්නාහිරට: රද්දලන සහ මාකඳුර පළාත් ;

2. නැදලගමුව පළාත/බස්නාහිර මැද පත්තු කෝරලය
   උතුරට: ඊරියගොල්ල පළාත ;
   දකුණට: බෝවත්ත පළාත
   නැගෙනහිරට: මඩිගෙපොල පළාත ;
   බස්නාහිරට: රද්දලන පළාත ;

3. රද්දලන පළාත/පිටිගල් කෝරලය
   උතුරට: නාබිරත්තන්කඩවර පළාත ;
   දකුණට: මාකඳුර පළාත ;
   නැගෙනහිරට: බෝවත් පළාත ;
   බස්නාහිරට: වෙල්පල්ල පළාත ;

4. මාකඳුර පළාත පිටිගල් කෝරලය
   උතුරට: රද්දලන පළාත
   දකුණට: නාලවලාන පළාත
   නැගෙනහිරට: ගලයාය පළාත
   බස්නාහිරට: ගෝනුල්ල සහ සඳ ලංකාව

5. ඇලබඩගම පළාත/බස්නාහිර මැද පත්තු කෝරලය
   උතුරට: කදිරපොල සහ බෝවත්ත පළාත් ;
   දකුණට: කොටුවැල්ල පළාත ;
   නැගෙනහිරට: කොටුවැල්ල සහ කදිරෙපොල පළාත් ;
   බස්නාහිරට: බෝවත්ත සහ ගලයාය පළාත් ;

2. මෙම ආඥාපනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර තහනම් කරනලද ඉහත සඳහන් සීමා ඇතුලත පිහිටි ප්‍රදේශවලට හෝ ඉන් පිටතට ගවයින් හෝ ගවයින් බදිනාලද වාහන මෙම දැන්වීම මා විසින් අවලංගු කරනතෙක් ගෙනියෑම, තහනම් කරමි.

3. තවද 1937 දී සම්මත කරනලද '' සතුන්ගේ බෝවන රෝග '' පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරනලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීතියානුකූලව ක්‍රියා කරන අයුරු, ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර කුලියපිටිය පශු වෛද්‍ය තැනගෙන් හෝ කටුගම්පොල හත්පත්තුව කරවන ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩිදුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලන්ගු බව දත යුතුයි.

ඒ. ඇල්. පෙරේරා,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ දිසාපති තැන.

1958 ක්වූ ජූනි මස 26 වැනි දින,
කුරුණෑගල කච්චේරියේදිය.

---

### ප්‍රකාශනයයි

අනුරාධපුර දිස්ත්‍රික්කයේ බටහිර සහ නැගෙනහිර නුවරගම් පළාත් කරවන ආදායම් නිලධාරි කොට්ඨාශවලට අයත් අංක 4 දරණ ගම්මුලාදැනි කොටසේ රලපනාව, අඳමපනේ සහ සිංගාරගම යන ගම්වල, සහ අංක 25 දරණ ගම්මුලාදැනි කොටසේ රත්මලේ, නැගටුනුවැව, ගඟුරුව සහ හිඳෙගම ද අංක 24 දරණ තුලානේ ගල්මඩුව සහ පුදුක්කුලම්ද, අංක 24ඒ දරණ තුලානේ නොච්චිකුලම යන ගම්වල ගවයින් අතර කුර සහ මුව වසංගත පැතිරී ඇති හෙයින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ දිසාපති ඩෙරික් අළුවිහාරේ වන මා විසින් සතුන්ගේ බෝවන රෝග සම්බන්ධ ආඥාපණතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වෙනි වගන්තිය යටතේ පහත සඳහන් මායිම්

ඇතුලත, බටහිර නුවරගම් පළාතේ අංක 4 සහ නැගෙනහිර නුවරගම් පළාතේ අංක 24, 24ඒ, සහ 25 යන ගම්මුලාදෑනි කොට්ඨාශ වසංගත ඇති ප්‍රදේශ මෙන් සළකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි :—

**අංක 4 දරණ ගම්මුලාදෑනි කොට්ඨාසය**

උතුරට: අංක 2 දරණ කුලානේ දකුණු මායිම ;

නැගෙනහිරට: අංක 13 දරණ කුලානේ බටහිර මායිම ;

දකුණට: අංක 6 දරණ කුලානේ උතුරු මායිම :

බස්නාහිරට: අංක 3 දරණ කුලානේ නැගෙනහිර මායිම.

**අංක 25, 24, සහ 24ඒ දරණ ගම්මුලාදෑනි කොට්ඨාශ**

උතුරට: අනුරාධපුර–ත්‍රිකුණාමලය මාවතේ සැතපුම් 56 සහ 66 අතර ප්‍රදේශය ;

නැගෙනහිරට: අළුත්ගම කුලානේ මායිම ;

දකුණට: හුරුළු පළාතේ වැව් කැලෑගම් සහ මැදලැස්ස කුලානේ මායිම් ;

බස්නාහිරට. කන්දරාමය.

2. මෙම ආඥාපනතේ 7 වෙනි වගන්තියේ ප්‍රකාර තහනම් කරන ලද ඉහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශයෙන් හෝ ඉන් පිටතට ගවයින් හෝ ගවයින් බඳින ලද වාහන මෙම දැන්වීම ප්‍රකාශ කර දෙමසක් ගතවන තුරු ගෙන යෑම තහනම් කරමි.

3. තවද 1937 සම්මත කරන ලද සතුන්ගේ බෝවන රෝග පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයට ඒ ඒ නිළධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත සිහිපත් කරවන අතරම මෙම නීති රීති සම්බන්ධව වැඩි විස්තර බටහිර නුවරගම් පළාත සහ නැගෙනහිර නුවරගම් පළාත කරවන ආදායම් නිළධාරීන්ගේ කාර්‍යාල වලින් හා මෙම කච්චේරියෙන් ලබාගත හැකි බව තව දුරටත් මෙයින් දන්වමි.

ඩී. අළුවිහාරේ,
අනුරාධපුර දිස්ත්‍රික්කයේ දිසාපති තැන.

1958 ජූලි 2 වෙනි දින,
අනුරාධපුර කච්චේරියේදීය.

---

## 1958වේ කතරගම ඇසළ පෙරහැර

කතරගම සහ සෙල්ල කතරගම වන්දනා ගමන් පිළිබඳ ව්‍යවස්ථා පනවා තිබෙන වර්ෂ 1948වේ අප්‍රියෙල් මස 30 වැනි දින අංක 9,859 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ද, වර්ෂ 1949 ජූලි 22 වැනි දින අංක 10,000 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේද, වර්ෂ 1958වේ පෙබරවාරි මස 7 වැනි දින අංක 11,255 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේද, පෙනී යන ප්‍රකාර පහත සඳහන් ව්‍යවස්ථා මහජනයාගේ කල්පනාවට භාජන කරමි :—

ඒ සම්බන්ධයෙන් දැනුම් දෙන වග නම් —

(අ) බලයලත් නිළධාරියාගෙන් අවසර පත්‍රයක් නොමැතිව කතරගම හෝ සෙල්ල කතරගම කඳවුරු ප්‍රදේශවල මොනම තාවකාලික ගොඩනැගිල්ලක්වත් ඉදිකිරීම තහනම්ය ;

(ආ) කතරගම පූජනීය ස්ථාන පිහිටි සීමාව තුල වෙළඳ පොළවල් පිණිස තාවකාලික ගොඩනැගිලි පාවිච්චි කිරීමට අවසර දෙනු නොලැබේ. එනම් :—

(1) මහ වීදිය.
(2) පිට වීදිය.
(3) පිට වීදිය සහ නාගහ වීදිය අතර තිබෙන බුත්තල පාර කොටස
(4) මහ වීදිය සහ පිට වීදිය ඒකාබද්ධවන පාරවල්.
(5) මහ දේවාලය, වල්ලි අම්මා දේවාලය, තෙයිවානි අම්මා දේවාලය යන දේවාල අවට ප්‍රදේශ.

(ඉ) කොන්ක්‍රීට් අඩිපාලමෙන් පහළ හැර ගඟේ සිට යාර සියයක් ඇතුලත කතරගම කඳවුරු ප්‍රදේශයේ කොයිම ස්ථානයකවත් හිස කෙස් හෝ රැවුල් කපන ස්ථාන පිහිටුවීමට ඉඩ දෙනු නොලැබේ ;

(ඊ) කතරගම මැණික් ගඟෙහි ගවයින් නෑවීමට වෙන්කොට තිබෙන කොටසට පහළින් නෑමට හෝ වතුර ගැනීමට ඉඩ දෙනු නොලැබේ. හදිසි රෝග බෝවීම වැළැක්වීම පිණිස නෑමට, බීමට සහ ගවයින් නෑවීමට විශේෂයෙන් වෙන්කර තිබෙන ස්ථාන පාවිච්චිකළ යුතුයි ;

(උ) බලයලත් නිළධාරියෙකුගේ අවසර පත්‍රයක් නොමැතිව කඳවුරු ප්‍රදේශය ඇතුළත බයිසිකල් සහ කරත්ත ඇතුළු මොනයම් රථවාහනයක්වත් නැවීමට ඉඩදෙනු නොලැබේ ;

(ඌ) සෙල්ල කතරගම ගංඉවුරෙන් යාර 30ක් ඇතුලත මොනයම් තාවකාලික ගොඩැනැගිල්ලක්වත් ඉදිකිරීම තහනම්ය.

මෙම ව්‍යවස්ථාවන්ට විරුද්ධව ක්‍රියා කරන අයට නීති ප්‍රකාර නඩු පවරනු ලැබේ.

බී. පී. වී. ඒ. ජේ. පී. සේනාරත්න,
බදුලු දිස්ත්‍රික්කයේ දිසාපති තැන.

1958 අප්‍රියෙල් 20 දින,
බදුළු කච්චේරියේදීය.

---

## 1958වේ කතරගම ඇසළ පෙරහැර

වර්ෂ 1948ක්වූ අප්‍රියෙල් මස 30 වැනි දින අංක 9,859 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ වර්ෂ 1948ක්වූ අප්‍රියෙල් මස 1 වැනි දින දරණ කතරගම සහ සෙල්ල කතරගම වන්දනා ගමන් පිළිබඳ 10(1) ව්‍යවස්ථාව අනුව බදුළු දිස්ත්‍රික්කයේ දිසාපති තැන්පත් බී. පී. වී. ඒ. ජේ. පී. සේනාරත්න වන මම, මෙහි පහත සඳහන් ස්ථාන වන්දනාකරුවන්ට ආහාර බෙදා දීමේ හෝ විකිණීමේ ස්ථාන හැටියට නියම කරමි:—

(1) මහ වීදිය හා පිට වීදිය දිගේ පිහිටි බලය ලත් ස්ථිර ගොඩනැගිලි.

(2) මෙහි පහත සඳහන් පාරවල් දිගේ එම පාරවල් වලට මූණ පා සාදා තිබෙන අවසරලත් ගොඩනැගිලි සහ මගේ අවසරය පිට සාදනලද තාවකාලික ගොඩනැගිලි :—

(අ) නාගහ වීදිය ;

(ආ) තිස්ස–කතරගම ප්‍රසිද්ධ මහාපාර සහ කටුගමුව පාර සන්දි වෙන ස්ථානයෙන් කටුගමුව පාරේ දකුණු දෙසට ;

(ඉ) තිස්ස–කතරගම ප්‍රසිද්ධ මහපාර සහ කටුගමුව පාර සන්දි වෙන ස්ථානයෙන් තිස්ස–කතරගම පාරේ උතුරු දෙසට.

(3) මගේ අනුමැතිය පිට තෙයිවානි අම්මා කෝවිල් ප්‍රදේශය ඇතුලත සාදා තිබෙන ස්ථිර ගොඩනැගිලි.

(4) සෙල්ල කතරගම තිබෙන අවසරලත් ස්ථිර ගොඩනැගිලි සහ මගේ අනුමැතිය පිට සාදන ලද තාවකාලික ගොඩනැගිලි.

(5) බුත්තල පාරත් නාගහපිටියත් සංදිවෙන ස්ථානයෙන් උතුරට පිහිටි ස්ථිර ගොඩනැගිලි සහ තාවකාලික ගොඩනැගිලි.

(6) කිරිවෙහෙරට මූණ ලා ඇති පාරේ සංචාරක බංගලාවේ වැට බැඳ ඇති සීමාවේ සිට කිරිවෙහෙර මළුව දක්වා ඇති ස්ථිර ගොඩනැගිලි.

පාර මැද්දේ සිට ගොඩනැගිල්ල ඉදිරිපස දුර ප්‍රමාණය අඩි පණහකට අඩුව තිබුණොත් එම ගොඩනැගිල්ල එම පාරේ පිහිටි ගොඩනැගිල්ලක් හැටියට මෙම දැන්වීමෙන් සලකනු ලැබේ.

ඉහත සඳහන් ස්ථාන හැර කතරගම හෝ සෙල්ල කතරගම කඳවුරු ප්‍රදේශය ඇතුළත අන්කිසි ස්ථානයක මොනම අන්දමේ කෑමක් හෝ බීමක් විකිණීම හෝ බෙදදීම තහනම්ය.

බී. පී. වී. ඒ. ජේ. පී. සේනාරත්න,
බදුළු දිස්ත්‍රික්කයේ දිසාපති තැන.

1958 අප්‍රියෙල් 20 දින,
බදුළු කච්චේරියේදීය.

---

## 1958වේ කතරගම ඇසළ පෙරහැර

වර්ෂ 1948ක්වූ අප්‍රියෙල් මස 30 වැනි දින අංක 9,859 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ වූ, වර්ෂ 1948ක්වූ අප්‍රියෙල්. මස 16 වැනි දින දරණ කතරගම සහ සෙල්ල කතරගම වන්දනා ගමන් පිළිබඳ ව්‍යවස්ථා අනුව බදුළු දිස්ත්‍රික්කයේ දිසාපති තැන්පත් බී. පී. වී. ඒ. ජේ. පී. සේනාරත්න වන මම, මෙහි පහත සඳහන් ප්‍රදේශ නා නා ප්‍රකාර බඩු වර්ග විකිණීම සඳහා සීමා කරමි :—

(1) මහවීදිය හා පිට වීදිය දිගේ මෙම පාර දෙක යා වෙන පාර දෙකෙළවර පිහිටි ස්ථිර ගොඩනැගිලි.

(2) නාගහ වීදියේ ගොඩනැගිලි.

(3) බුත්තල පාර සහ නාගහ වීදිය සංදිවෙන ස්ථානයේ සිට බුත්තල පාරේ උතුරු දෙසට තිබෙන ගොඩනැගිලි.

(4) තිස්ස–කතරගම ප්‍රසිද්ධ මහපාර සහ කටුගමුව පාර සංදිවෙන ස්ථානයේ සිට කටගමුව පාරේ දකුණු දෙසට තිබෙන ගොඩනැගිලි.

(5) තිස්ස–කතරගම ප්‍රසිද්ධ මහපාර සහ කටුගමුව පාර සංදිවෙන ස්ථානයේ සිට තිස්ස–කතරගම ප්‍රසිද්ධ මහපාරේ උතුරු දෙසට තිබෙන ගොඩනැගිලි.

(6) සෙල්ල කතරගම පිහිටි ස්ථිර ගොඩනැගිලි.

(7) බලයලත් නිළධාරියෙකුගේ අවසර පත් පිට සෙල්ල කතරගම් සාදන ලද තාවකාලික ගොඩනැගිලි,

(8) කිරිවෙහෙරට මූණ ලා ඇති පාරේ සංචාරක බංගලාවේ වැට බැඳ ඇති සීමාවේ සිට කිරිවෙහෙර මළුව දක්වා.

පාර මධ්‍යයේ සිට ගොඩනැගිලි ඉදිරිපස දුර ප්‍රමාණය අඩි පණහකට අඩුව තිබුණොත් එම ගොඩනැගිල්ල එම පාරේ පිහිටි ගොඩනැගිල්ලක් හැටියට සලකනු ලැබේ. මේ හැර වෙන කිසිම ස්ථානයක කඳවුරු ප්‍රදේශයේ වෙළඳාම් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

බී. පී. වී. ඒ. ජේ. පී. සේනාරත්න,
බදුළු දිස්ත්‍රික්කයේ දිසාපති තැන.

1958 අප්‍රියෙල් 20 දින,
බදුළු කච්චේරියේදීය.

---

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.